# 2022.01.11 දින කල් තබන ලද මාසික මහ සභා රැස්වීම 2022/01/25

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/01/11 වන දින කල්තබන ලද මහ සභාව 2022/01/25 වන දින පෙ.ව 09.30 ට පමණ නැවත අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අතර එදින පැවැත්වූ කල් තබන ලද මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

<u>මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා</u>

1. ගරු සභාපතිනී - පද්මා වැත්තැව මැතිණිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී.ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - එච්.ඒ.සී.නිලූ ගුණරත්න මැතිණිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.චමින්ද වර්ණසූරිය මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

<u>මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා</u>

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා

ගරු සභාපතිනී පද්මා වැත්තැව මැතිණිය

**2022/01/11 වන දින පවත්වන ලද මහ සභාවේ කටයුතු අද දින දක්වා එදින කල් තැබුවා. ඒ අනුව අද දින එම කල්තබන ලද රැස්වීමේ කටයුතු පවත්වාගෙන යාමට රැස්වූ ඔබ සියළු දෙනා පිළිගනිමින් එදිනට අදාළ න්‍යාය පත්‍රයේ ඉදිරි කටයුතු ඔබ වෙත ඉදිරිපත් කරනවා.**

**මේ අවස්ථාවේ ගරු උපසභාපති ධර්මරත්න හේරත් මැතිතුමන් අදහස් ඉදිරිපත් කිරීමට නැගී සිටි අතර ගරු සභාපතිතුමිය විසින් කල් තබන ලද මහ සභා රැස්වීමේ කටයුතු න්‍යාය පත්‍රයට පරිබාහිරව ඉටුකිරීමත් න්‍යාය පත්‍රයේ සදහන් කරුණු වලට පරිබාහිරව අදහස් දැක්වීම 1988**

**ප්‍රාදේශීය සභා රැස්වීම් කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටියට පටහැනි බවත් ඒ අනුව වෙනත් කරුණු යටතේ අදහස් දැක්වීමට අවස්ථාව ලබාදෙන බවත් සඳහන් කරන ලදි. එහෙත් ගරු උපසභාපති ධර්මරත්න හේරත් මැතිතුමා තවදුරටත් තමන්ට අදහස් පල කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස දිගින් දිගටම ඉල්ලා සිටින ලදි . එහිදී ගරු සභාපතිතුමිය විසින් 1988 ප්‍රාදේශීය සභා රැස්වීම් කටයුතු කරගෙන යාම පිළිබඳ රීති මාලාව සියළුම දෙනා දැන සිටිය යුතු බවත් ඒ අනුව කටයුතු කිරීමට සියළුදෙනා බැඳී සිටින බවත් එබැවින් වෙනත් කරුණු වලදී අදහස් පල කිරීමට අවස්ථාව ලබා දෙන තෙක් ගරු උප සභාපති ධර්මරත්න හේරත් මැතිතුමන්ට අසුන් ගන්නා ලෙස දෙවන වරටත් ප්‍රකාශ කරන ලදි. එහෙත් තවදුරටත් දිගින් දිගටම බාධාකාරී ලෙස ගරු උප සභාපතිතුමන් විසින් අදහස් පල කරන්නට වූයෙන් ගරු සභාපතිතුමිය විසින් ගරු උපසභාපති ධර්මරත්න හේරත් මැතිතුමන්ට එසේ බාධාකාරී ලෙස නොහැසිරෙන ලෙසත් 1988 ප්‍රාදේශීය සභා රැස්වීම් කටයුතු කරගෙන යාම පිළිබඳ රීති සංග්‍රහයේ 20 වන වගන්තියේ සඳහන් පරිදි විනය ආරක්ෂා කිරීමට සියළු මන්ත්‍රීවරුන් බැඳී ඇති බවත් එම රීති සංග්‍රහයේ 29 වන වගන්තියේ සඳහන් නියමයන් ආරක්ෂා කිරීමට සියළු සභිකයින් බැඳී ඇති බවත් එසේ කටයුතු නොකරන්නේ නම් විනය විරෝධී හැසිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදුවන බවත් සඳහන් කරමින් ගරු උපසභාපති ධර්මරත්න හේරත් මැතිතුමන්ට තුන්වන වරටත් අසුන්ගන්නා ලෙස දැනුම් දෙන ලදි. නමුත් තවදුරටත් දිගින් දිගටම බාධාකාරී ලෙස ගරු උප සභාපති ධර්මරත්න හේරත් මැතිතුමා විසින් අදහස් පල කරන්නට වූයෙන් සිව්වැනි වරටත් අසුන් ගන්නා ලෙස දැනුම් දී අසුන් ගන්වන ලදි.**

**අනතුරුව ගරු සභාපතිතුමිය න්‍යායපත්‍රානුකූලව පහත කරුණු ඉදිරිපත් කරන ලදි.**

**(05-4)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා විසින් කරනු ලබන අංක 06/46 - 04 දරණ යෝජනාව</u>**

2022 වර්ෂය සඳහා මන්ත්‍රීවරුන් හට වෙන්වී ඇති මුදලින් සිදු කිරීමට මා විසින් අයවැයට ඉදිරිපත් කරන ලද ජයම්වත්ත, 6 කණුව ප්‍රජා ශාලාවට දැල් ගසා ආරක්ෂිත ග්‍රිල් වැටක් ඉදි කිරීමේ යෝජනාව (රු.500,000.00) සංශෝධනය කර පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

1. ජයම්වත්ත වටරවුම් මාර්ගයේ කේ.ජී. කුසුමාවතී මහත්මියගේ නිවස අසල සිට පහළට යන අතුරු මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම - (රු.200,000.00)
2. 6 කණුව සභාව සතු ප්‍රජා ශාලා භූමිය පස් දමා සකස් කිරීම - (රු. 100,000.00)
3. දිද්දෙණිය සිට මැදගංගොඩ මාර්ගයේ වෙල කොටස බොරළු දමා සංවර්ධනය කිරීම - (රු.200,000.00)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව ඉහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-5)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා විසින් කරනු ලබන අංක 06/46 - 05 දරණ යෝජනාව</u>**

2022 වර්ෂයේ අයවැය යටතේ මා හට හිමි වී ඇති ප්‍රතිපාදන මුදලින් පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

1. නො 08 අභ්‍යන්තර මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම - (රු. 100,000.00)
2. ගල්ඔලියාව අයිරා මහත්මියගේ කඩය සිට වැලිකරේ දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම - (රු. 100,000.00)

3. වැලිකරය ලහිරු මහතාගේ නිවස ඉදිරිපිට සිට ගල්ගමුව ක්‍රීඩාපිටිය දෙසට යන මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම - (රු. 100,000.00)
4. තැම්පිටිගොඩ සිට නල්ලූර දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම - (රු. 100,000.00)
5. නල්ලූර අභ්‍යන්තර මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම - (රු. 100,000.00)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව ඉහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-6)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/46 - 06 දරණ යෝජනාව</u>**
නැගෙනහිර වෙන්නොරුව පදිංචි එස්.පී. කිත්සිරි ප්‍රභාත් වීරවංශ මහතාගේ නිවස පිටුපස නාය යෑමට ලක් වූ කොටසේ පස් කන්ද ඉවත් කර ගැනීමට අලව්ව ප්‍රාදේශීය සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම නිවස පිටුපස නාය යෑමට ලක් වූ පස් පමණක් (ඉවුර නොකැපිය යුතුයි.) වර්ෂාව රහිත වියළි කාලගුණ තත්වයක් යටතේ ඉවත් කර ගැනීමට සුදුසු බව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් වාචිකව උපදෙස් ලබා දී ඇති බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දන්වා ඇති අතර ආපදා අවස්ථාවේදී සිදු වූ හානියක් බැවින් කාර්මික නිලධාරී වාර්තාවට අනුව අදාල යන්ත්‍ර යෙදවීම සම්බන්ධයෙන් සභා තීරණයක් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,කාර්මික නිලධාරී වාර්තාවට අනුව අදාළ යන්ත්‍ර යෙදවීම සුදුසු බවට යෝජනාව කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව කාර්මික නිලධාරී වාර්තාවට අනුව අදාල යන්ත්‍ර යෙදවීම සුදුසු බවට ගෙන ආ එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**(05-7)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/46 - 07 දරණ යෝජනාව</u>**
අලව්ව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් යොමු කර ඇති ලිපියට අනුව කොරෝනා වසංගත තත්වය ආරම්භයේ සිටම මේ දක්වා කොරෝනා රෝගීන් සහ ආශ්‍රිතයන් නිරෝධායනය වෙනුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා ඉන්ධන දීමනාව ලබා දීම වෙනුවෙන් ස්තූතිය පුද කර ඇති අතර තවදුරටත් රෝගීන් වාර්තා වීම සිදු වන බැවින් මෙතෙක් මසකට ලබා දුන් පෙට්‍රල් ලීටර් 30 ක දීමනාව ඉදිරියටත් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව කොරෝනා අවධානම තවදුරටත් පවතින බැවින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ට ලබාදෙන මෙම දීමනාව තවදුරටත් ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා පෙට්‍රල් ලීටර් 30 ක ඉන්ධන දීමනාව තවදුරටත් ලබාදීම සුදුසු බවට ගෙන ආ එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-8)**<u>**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/46 - 08 දරණ යෝජනාව**</u>

ඝණ අපද්‍රව්‍ය කලමණාකරණ මධ්‍යස්ථානයේ කසළ කඳු පෙරලීම, පොහොර කඳු කැඩීම, පොලිතින් බ්‍රේල් ඉවත් කිරීම යනාදී සේවකයින්ට වෙහෙසකර වැඩ කොටසක් අවම කර ගනිමින් ව්‍යාපෘතිය පවත්වාගෙන යාමට බොබ් කැට් යන්ත්‍රයක අවශ්‍යතාවය පවතී. මෙම යන්ත්‍රයක දළ වටිනාකම ලක්ෂ 50 ක් පමණ වන බැවින් සභාවට සෘජුව මිලදී ගැනීමේ හැකියාවක් නොමැති අතර මෙය පළාත් පාලන අමාත්‍යාංශයෙන් ද ඉල්ලීම් කර ඇතත් මේ වන තෙක් ලැබී නොමැත. එහෙත් ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කටයුතු සඳහා මෙය ඉතා අත්‍යාවශ්‍ය යන්ත්‍රයක් වන බැවින් දේශීය ණය අරමුදලින් හෝ මෙම යන්ත්‍රය ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කටයුතු සඳහා දේශීය ණය අරමුදලින් හෝ බොබ්කැට් යන්ත්‍රයක් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-09)**<u>**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/46 - 09 දරණ යෝජනාව**</u>

කොහොලාන අලව්ව ලිපිනයේ පදිංචි පී.පී.එච්. වීරක්කොඩි යන අය විසින් තමාගේ නිවස අසල ශීතකල මාළු විකිණීම සඳහා වෙලඳ බලපත්‍රයක් ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇත. මෙම ඉල්ලීම පිළිබඳ සලකා බැලීමේදී දැනට 2022 වර්ෂය සඳහා අලව්ව නගරයේ මාළු කඩ 04 බදු ලබා දීමට ගිවිසුම්ගත වී ඇති අතර අලව්ව නගරයට ආසන්න ප්‍රදේශයක් වීම හා අලව්ව සභාවේ සීමාව වන වලකුඹුර ප්‍රදේශයේද ටෙන්ඩර් මාළු ලැල්ලක් ඇති බැවින් මෙම ස්ථානයේ මාළු ව්‍යාපාරයක් ආරම්භ කිරීම තුලින් ටෙන්ඩර්කරුවන්ගේ විරෝධතාවයක් මතුවිය හැකි බවත් මේ සඳහා අවසර ලබා දීම පිළිබඳ යම් ගැටළුකාරී තත්වයක් ඇතිවිය හැකි බවත් ආදායම් පරීක්ෂක විසින් වාර්තා කර ඇති අතර එබැවින් මෙම මාළු විකිණීම සඳහා බලපත්‍රයක් ලබාදීම සුදුසු නොවන බවට නිර්දේශයක් ඉදිරිපත් කර තිබෙනවා.මේ සඳහා ගරු මහ සභාව විසින් තීරණයක් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔබ තුමිය ඉදිරිපත් කල යොජනාවට අනුව කටයුතු කිරීම සුදුසු බවට මා ස්ථිර කරනවා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-10)**<u>**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/46 - 10 දරණ යෝජනාව**</u>

තමා ඇතුළු පවුල් 07 ක් සඳහා ජල සැපයුමක් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති බවත් ඒ සඳහා මාර්ගය පළුදු කිරීමට අවශ්‍ය වී ඇති බැවින් ඒ සඳහා ප්‍රාදේශීය සභාව විසින් ඇස්තමේන්තු කර ඇති රු. 154,160.00 ක් වැනි මුදලක් ඔවුන් හට ගෙවීමට අපහසු බවත් එය නිදහස් කර දෙන

බවත් මාර්ගය පළුදු කරන කොටස යථා පරිදි සකස් කර දෙන ලෙසත් දන්වා වෙදගෙදර, යටිගල්ඔළුව පදිංචි පී.එම්.එල්. පතිරාජ මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර

යටිගල්ඔළුව ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව යටිගල්ඔළුව වසමේ ප්‍රජා ශාලාව අසලින් පී.එම්.එල්. පතිරාජ මහතාගේ නිවස දක්වා යන මාර්ගය ඩී. ආරියරත්න යන අයගේ නිවසෙහි වැට දක්වා කොටස රජයේ ප්‍රතිපාදන මත කොන්ක්‍රීට් අතුරා ඇති බවත් පී.එම්.එල්. පතිරාජ යන අයගේ නිවස දක්වා කොටස එම අයගේ පුද්ගලික වියදමින් කොන්ක්‍රීට් දමා සකසා ඇති බවත් එම මාර්ගයේ ජල නළ එළීම මගින් පවුල් 06 ක් පමණ ප්‍රතිලාභ ලබන බැවින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු මුදල වන රු. 154,160.00 ක මුදල සංශෝධනය කර දීම සුදුසු බවට නිර්දේශ කර තිබෙනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,ජල නල එළීම සඳහා පළුදු කිරීමට නියමිත මාර්ගයෙන් කොටසක් රජයේ ප්‍රතිපාදන මත කොන්ක්‍රීට් අතුරා තිබුනද වැඩි කොටසක් කොන්ක්‍රීට් කර තිබෙන්නේ පෞද්ගලික ධනයෙනුයි. එම නිසා ඔවුන්ට සහනයක් ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පළුදු කරන කොටස යථා පරිදි සකසා දෙන බවට මෙම පුද්ගලයින් පොරොන්දු වෙනවා නම් අදාල මුදලින් නිදහස් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා. එමෙන්ම ජල නල එළීමෙන් පසුව කොන්ක්‍රීට් කිරීමේදී එය ප්‍රමිතියකට අනුව කාර්මික නිලධාරි මහතෙකුගේඅධීක්ෂණය යටතේ සිදුකරන ලෙසත් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. මෙම මාර්ග කොටසෙන් වැඩි කොටසක් ඉදි කර තිබෙන්නේ පෞද්ගලික වියදමෙනුයි. එමෙන්ම ජල සම්පාදන මණ්ඩලය විසින් මෙම ජලනල පද්ධතිය එළිම සිදු කරනු ලබන්නේ අනෙක් නිවෙස් වලටත් අවම ගාස්තුව යටතේ ජලය ලබා ගැනීමේ පහසුව සැලසෙන ආකාරයටයි. ඒ සඳහා සම්පූර්ණ වියදම මොවුන් විසින් දරන නිසා ඒ තුලින් ප්‍රදේශයේම ජනතාවට සේවයක් ද සිදු වෙනවා. එම නිසා මෙම කාරණය සැලකිල්ලට ගෙන දිය හැකි උපරිම සහනය ලබාදෙන ලෙස ඉල්ලා සිටින අතර නැවත ඉදිකිරීමේදී තාක්ෂණික කාරණා අනුව ඉදිකලයුතු බවත් ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ පිළිබඳව සානුකම්පිතව බලා අදාල මුදලින් නිදහස් කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව පළුදු කරන කොටස යථා පරිදි සකසා දෙන බවට මෙම පුද්ගලයින් පොරොන්දු වෙනවා නම් අදාල මුදලින් නිදහස් කිරීම සුදුසු බවටත් එමෙන්ම ජල නල එළීමෙන් පසුව කොන්ක්‍රීට් කිරීමේදී එය ප්‍රමිතියකට අනුව කාර්මික නිලධාරී මහතෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකිරීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**<u>06. ඇස්තමේන්තු ඉදිරිපත් කිරිම</u>**

**<u>07.නිවාඩු ලිපි ඉදිරිපත් කිරිම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද දින සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හට අද දිනය නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ර්.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියගේ නිවාඩු අනුමත කිරීම ඒකමතිකව සභා සම්මත විය.

**08.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

**(08.1)** මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2021.12.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,2021.12.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2021.12.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.2)** නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2021.12.28 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2021.12.28 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2021.12.28 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.3)**කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2021.12.29 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2021.12.29 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2021.12.29 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.4) ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
2021.12.27 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2021.12.27 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2021.12.27 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>09. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව හා ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කිරීම</u>**

**<u>9.1. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා .

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 9.2. ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර්මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,ගිය සභා වාරයේදී අපි විසින් යම් විරෝධතාවයක් දක්වනු ලැබුවා. ඉදිරි කාලයේදී සාකච්ඡාවක් සිදු කර එකඟතාවයට පත් කරන බවට පොරොන්දුවක් තිබෙන නිසා මෙම මහා සභාව පවත්වාගෙන යාමට අපගේ විරෝධතාවයක් නොමැති බව ප්‍රකාශ කරනවා.

චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමා විසින් මගේ කොට්ඨාශයේ මාර්ග කාපට් කිරීම, වීථි ලාම්පු සකස් කිරීම ආදිය මා සම්බන්ධ කරගැනීමකින් තොරව සිදු කරනවා. එය ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රිවරුන් වන අපට ගැටළුවක්. ඒ නිසා ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රිවරුන් වන අපට මූලිකත්වය දිය යුතුයි.

ගරු සභාපතිතුමියනි, අපි එකඟතාවයකට පැමිණියා නම් යම් වැඩපිළිවෙලක්ඉදිරියට ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලැබෙනවා. එම නිසා ඉදිරියේදී ආණ්ඩු පක්ෂයේ සියළු දෙනා රැස්කර සාකච්ඡා සිදු කර එකඟතාවයෙන් යන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගරු උප සභාපතිතුමා පැවසූ වීථි පහන් සැදීම සහ මාර්ගය කාපට් කිරීම සම්බන්ධව යමක් ප්‍රකාශ කල යුතුයි.ගරු සන්ධ්‍යා කුමාර සභාපතිතුමාගේ කාලයේ ශ්‍රීයානි ජයලත් මන්ත්‍රීතුමියටත්, අරුණ මන්ත්‍රීතුමාටත්, මටත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහන යටතේ කාපට් කිලෝමීටර් 2 බැගින් නම් කරන ලෙස පැවසුවා. ඒ අනුව අපිටත් අවස්ථාව දෙන ලෙස ඉල්ලා කිලෝමීටර් 2 බැගින් නම් කර යවනු ලැබුවා. එහිදී මම නම් කලේ පොරමඩල වලකුඹුර මාර්ගයයි. එම නිසා එම පාර සංවර්ධනය කලේ මගේ යෝජනාව අනුව ද නැතහොත් වෙනත් කෙනෙකුගේ යෝජනාවක් අනුව දැයි මම දන්නේ නැහැ. කෙසේ වෙතත් ප්‍රදේශයේ මාර්ගයක් සංවර්ධනය කරන විට අවශ්‍ය සහයෝගයමා විසින් ලබා දෙනු ලැබුවා.

ගරු සභාපතිතුමියනි, වීථි පහන් සකස්කිරීමේදී කොට්ඨාශයේ මන්ත්‍රීවරුන් දෙදෙනාම සම්බන්ධ කර ගන්නා ලෙස ඔබතුමිය පැවසුවා. ඒ අනුව වීථි පහන් සකස් කිරීමට අපේ කොට්ඨාශයට පැමිණි අවස්ථාවේදී උප සභාපතිතුමා සම්බන්ධ කර ගැනීමට උත්සාහ කලත් එතුමා ඒ සඳහා සම්බන්ධ කර ගැනීමට නොහැකි වුනා. එතුමා ඒ වනවිට සිටියේ උලපනේ ප්‍රදේශයේයි. වීථිපහන් සකස් කරන අය මීට පෙර ආපු දිනයේත් එතුමා සම්බන්ධ කර ගත නොහැකිව ඵලදායීව එම කාර්ය සිදුකිරීමට නොහැකි වුනා. මට සම්බන්ධ වුනු මොහොතේ සිට මම හැකි උපරිමයෙන් එම කාර්ය ඉටුකරගත්තා. හෘදසාක්ෂියට එකඟව අපි කටයුතු කරද්දීත් අයථා ලෙස චෝදනා නොකරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය සභා වාරයේ සිදු වූ සිදුවීම පිළිබඳ ආණ්ඩු පක්ෂයේ මහජන නියෝජිතයින් ලෙස අපි කණගාටුව ප්‍රකාශ කර සිටිනවා. පක්ෂයේ අභ්‍යන්තරයේ තිබූ ප්‍රශ්නයක් ගරු සභාවට ගෙන ඒම පිළිබඳව ගරු සභාවෙන් සමාව හජනය කරනවා. මෙහිදී ආණ්ඩු පක්ෂයේ එම මන්ත්‍රීතුමන්ලාගේ පැත්තෙන් බලන විට යම් සාධාරණ කරුණු ගොනු වී තිබෙනවා. අත්දැකීම් බහුල සභාපතිතුමියක් ලෙස ඉදිරියේදී මෙම සභාව ජනතාවගේ ප්‍රසාදයට ලක් වන අයුරින් පවත්වාගෙන යාමට හැකියාව ලැබේ යැයි සිතනවා. ඉදිරියේදී අපි ගරු සභාපතිතුමියත් සමඟ පුළුල් සන්ධානයක් ගොඩනගා අලව්ව බලප්‍රදේශය දියුණු කිරීමට හැකි උපරිම ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙනවා. ඒ අනුව ගරු සභාපතිතුමිය සාධාරණ තීන්දුවක් ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. එසේ නොමැති වුවහොත් ඇතැම් මන්ත්‍රීවරුන් මන්ත්‍රී ධූරයෙන් ඉවත්වන තත්වයක් පවා ඇතිවේවි. ඔබතුමිය එම කටයුත්තට දායක නොවනු ඇතැයි අපේක්ෂා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ජනතා සේවකයින් ලෙස අපි අතර යම් යම් මතිමතාන්තර මෙන්ම වාද විවාද ඇති වෙනවා. ජනමාධ්‍ය මගින් ඒවා ආණ්ඩුවට පහර ගැසීම සඳහා යොදාගෙන තිබුණා. ගරු සභාපතිතුමියනි, අපි ඉල්ලා සිටින්නේ කොට්ඨාශය තුල යම් කටයුත්තකදී මෙන්ම මෙම සභාවේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ප්‍රධානත්වය ලබා දී කටයුතු කරන ලෙසයි. මෙම තනතුර ලැබීමට පෙර වුවත් දිවංගත සන්ධ්‍යා සභාපතිතුමාගේ කාලයේ නුංගමුව කොට්ඨාශයේ වැඩිපුරම වීදි ලාම්පු දැම්මේ මමයි. නමුත් දැන් මන්ත්‍රීවරු දෙන්නා තුන්දෙනා එකට දමා වීථි ලාම්පු සකස් කිරීමට යන විට ගැටළු ඇති වෙනවා. මෙම කටයුත්ත කරන විට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මූලිකත්වය දී වෙන වෙනම දින සහ වේලාවල් ලබා දුනහොත් මෙවැනි ගැටළු ඇතිවෙන්නේ නෑ. එමෙන්ම ආණ්ඩු පක්ෂයක් ලෙස ඔබතුමිය සමඟ සාකච්ඡාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි,ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු ඔබතුමිය ඔවුන් පසෙකලා විපක්ෂයේ අපට සලකමින් කටයුතු කරන බවට බොරු ප්‍රචාර පතුරනවා. මම ඔබතුමියගෙන් වාහනයක් ලබා ගෙන ගොස් පාරක් කැපූ බවට චෝදනා කර සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වුනා. මම එසේ පාරක් කැපුවේ නැහැ. එම මාර්ගය සකස් කලේ හිටපු සභාපති සන්ධ්‍යා කුමාර මැතිතුමාගේ කාලයේයි. මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයට මුදල් බැඳලයි ඒ අවස්ථාවේ මම ඒ පාර කපන්න යන්ත්‍රය ලබාගත්තේ.ඒ මාර්ගය හරහා බොරළු කපන ටිපර් රථ ගමන් කරනවා. ඒකට ප්‍රදේශයේ මිනිස්සුන්ගෙ පැවති විරෝධතාවය ඔබතුමියත් දුටුවා . ඒ අනුව එම මාර්ගය කැඩෙන විට සකස් කලේ බොරළු අදින පුද්ගලයින් විසිනුයි. ඒ මිසක් සමාජ මාධ්‍ය ඔස්සේ ඇතැම් මන්ත්‍රීවරු පල කරන විදියට ඔබතුමිය අපට ප්‍රතිපාදන ලබා දීල සංවර්ධනය කිරීමක් සිදු කලේ නෑ. එමෙන්ම අපි වීථි පහන් ටික දමා ගත්තේත් ඔබතුමිය සකස් කරපු වැඩපිළිවල යටතේයි. අපේ විදුලි කාර්මික මහතුන් කොට්ඨාසයට එන දිනයේදී අපි අපේ මුදලින් අවශ්‍ය බඩු ටික ගෙනල්ලයි අළුත් වීථි පහන් දැම්මේ. සන්ධ්‍යා සභාපතිතුමා විසින් අපි සියළුදෙනාටම වීථි පහන් 05 බැගින් ලබා දුන්නා. දැන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් අපිට එසේ ලබා නොදෙන ලෙස පවසනවා. බහුතරය ආණ්ඩු පක්ෂයේ වුවත් අපි සියළු දෙනා මේ සභාවේ සභිකයිනුයි. මේ වගේ අසත්‍ය ප්‍රචාරය පල කිරීම හා ප්‍රකාශ කිරීම පිළිබඳව මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සභා ඉතිහාසය දෙස බැලූ විට පසුගිය සභාවේ සිදු වූ සිදු වීම තරම් අවාසනාවන්ත සිදු වීමක් වෙනත් කිසිදු සභා වාරයක සිදු වී නැහැ. පළමු වතාවට එවන් සිදුවීමක් සිදු වීම සම්බන්ධව අපි කණගාටු වෙනවා. එමෙන්ම ඉදිරියේදී එවන් අවාසනාවන්ත සිදුවීම් සිදු නොවේවායි ප්‍රාර්ථනා කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් ලෙස සිටියත් අපිත් මහජන නියෝජිතයොයි. අපි කිසිම විටක සභාව අපහසුතාවයට පත්කිරීමට කටයුතු කර නැහැ. සභාවේ ගරුත්වය ආරක්ෂා කිරීමට සෑම මොහොතකම කටයුතු කර තිබෙනවා.

ඔබතුමියගේ වීථි පහන් සකස් කිරීමේ වැඩපිළිවෙල ඉතාම හොඳ වැඩපිළිවෙලක්. මෙතෙක් කිසිදු සභාපතිවරයෙකුට නොපෙනුන කාරණයක් ඔබතුමියට ආරම්භයේදීම පෙනීම පිළිබඳව අගය කරනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයාත් සමඟ සහසම්බන්ධ වී අදාල ප්‍රදේශයේ වීථි පහන් සකස් කිරීම හැරුණු විට අපි ඔබතුමියගෙන් වෙනත් ප්‍රයෝජනයක් රැගෙන නොමැති බව මතක් කල යුතුයි. මගේ පෞද්ගලික අවබෝධය අනුව පෞද්ගලික අපේක්ෂාවන් මුදුන් පමුණුවා ගැනීමේ අදහසින් පටු ආකල්ප වල සිට ගැටුම් නිර්මාණය කරනු ලබන්නේ මේ සභාවේ සිටින දෙතුන්දෙනෙකු පමණයි. මෙම සභාපති ධූරය මේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න වලට විසඳුම් සොයන මුල් පුටුවයි. එහි සිටින පුද්ගලයා පිළිබඳව අපිට ප්‍රශ්නයක් නැහැ. ජනතා නියෝජිතයින් ලෙස අපේ කාර්යභාරය විය යුත්තේ එම පුද්ගලයාට ප්‍රදේශයේ ජනතාවට උපරිම ආකාරයේ සේවයක් කිරීමට සහයෝගය ලබා දීමයි.

2021.12.14 දින පැවති පසුගිය සභා වාරයේ සභා වාර්තාව අවසානයේ ඔබතුමියගේ අදහස් පලකිරීම යටතේ ඔබතුමිය විසින් කළ ප්‍රකාශය සියළු දෙනාගේම අවධානයට මම යොමුකරන්නම්.

**“ මාර්ග සංවර්ධනය, විදුලිය, වාහන ලබා දීම ආදිය සඳහා සෑම මන්ත්‍රීවරයෙකුටම අවස්ථාවක් ලබා දිය යුතු බැවින් ඒවා පෙල ගස්වා ගෙන පිළිවෙලකට සිදු කිරීමටයි සූදානම් කරගෙන ඉන්නේ. තවම මට නිසි ලෙස වැඩ කිරීමට ලැබුනේ සති තුනක් පමණ කාලයකුයි. නිලධාරීන්ටත් සැහැල්ලුවෙන් වැඩ කිරීමට හැකි පරිසරයක් නිර්මානය කිරීමත්, මන්ත්‍රීතුමන්ලාටත් තමන්ගේ ගම තුල අභිමානයක් ඇතිව සිටීමට කටයුතු කිරීමටත් හැකි පරිසරයක් තුල ජනතා අවශ්‍යතා ඉටු කර දීම මගේ අරමුණයි. වීථි පහන් අළුත්වැඩියාව සඳහා මෙවැනි වැඩපිළිවෙලක් සකස් කලේත් ඒ අනුවයි. එහිදී කාර්යශූර මන්ත්‍රීවරයා තමන්ගේ වැඩ කොටස සිදු කරගන්නවා. ඔබතුමන්ලා ඒවායින් ප්‍රයෝජන ලබා ගන්න. සභාපති ලෙස මට තනිවම මුළු බල ප්‍රදේශයේම වැඩ කල නොහැකියි. එසේ කිරීමට අවශතාවයකුත් නැහැ. අපි එකමුතුකමින් කටයුතු කරනවා නම් ගැටළු ඇති වන්නේ නෑ. එමෙන්ම වර්ෂ අවසානය නිසා ඉල්ලා සිටින සංවර්ධන කටයුතු සියල්ල සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේ අපහසුතාවයක් තිබෙනවා. ලබන වර්ෂයේ සියල්ල හැකි ආකාරයට තවදුරටත් සැලසුම් කර ගනිමු. 2022 වර්ෂයේ අපි සියළු දෙනාටම එක් වී කිසිවෙකුත් අපහසුතාවයට පත් නොවී ජනතා නියෝජිතයාගේ වටිනාකම ගමට දැනෙන ආකාරයට කටයුතු කිරීමට හැකි වේ යැයි මම බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ඔබේ සහයෝගය මා ඉල්ලා සිටින අතර මගේ සහයෝගය ඔබ වෙත ලබා දෙන බවත් ප්‍රකාශ කරනවා.”**

මේ ප්‍රකාශනය දෙස බලන විට එය බොහොම අවංක ප්‍රකාශනයක් බව පෙනෙනවා. මෙතෙක් සිටි කිසිදු සභාපතිවරයෙකුගේ මෙවැනි අවංක ප්‍රකාශනයක් මා දුටුවේ නෑ. මේ ප්‍රකාශනයේ තිබෙන්නේ වැඩ කිරීමට තිබෙන ආසාවේ දැක්මයි. ඒ සඳහා අපි ඔබතුමියට දිවි හිමියෙන් සහය දෙන බව ප්‍රකාශ කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, බෝයවලාන නගරයේ සතිපොළ භූමියේ එළවළු ව්‍යාපාරයක් කිරීම සඳහා පුද්ගලයෙකු විසින් ඉල්ලීමක් කර තිබෙනවා. ඒ සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ප්‍රදේශයේ මහජන නියෝජිතයින් ලෙස අපේ රාජකාරිය වන්නේ ප්‍රදේශයේ ජනතාවගෙන් ඉල්ලීම් ලිපියක් ලැබුණු විට එය ගරු සභාවට ඉදිරිපත් කර අදාල කාරණය ඉටු කර දීමයි. එදා අපි හිටපු ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේ බලප්‍රදේශයේ වීථිපහන් නඩත්තුවක් සම්බන්ධයෙන් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් වුවහොත් පක්ෂ පාට භේදයකින් තොරව එය සිදුකර දෙන ලෙසයි. සභාවක් ලෙස මේ සභාවේදී ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවය අනුව යම්කිසි හොඳ යෝජනාවක් ගෙනාවා නම් අපි එකහෙලා එයට සහයෝගය ලබා දුන්නා. ප්‍රාදේශීය සභා පණත අනුව අපේ වගකීම වන්නේ සභිකයින් ලෙස සියළු දෙනා එකතුවී බලප්‍රදේශයේ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් සභාවේ ගෞරවය සහ අභිමානය රැකෙන පරිදි කටයුතු කිරීමයි. අපිට සභාපති ධූරය හොබවනු ලබන්නේ කවුරුන්ද යන්න අදාල වන්නේ නෑ. මේ සභාවේ ප්‍රධාන විධායකය ලෙස මුලසුන හොබවන පුද්ගලයා මේ සභාවේ ගෞරවය සහ අභිමානයට හානි නොවන ආකාරයට හැසිරෙන තාක් කල් ගන්නා වූ සියළුම නිවැරදි තීන්දු තීරණ වෙනුවෙන් අපිට හැකි උපරිම සහයෝගය ලබා දීම අපි කවදත් කලා. ඉදිරියටත් එසේමයි. ජනමාධ්‍ය, සමාජ මාධ්‍යය හරහා අප්‍රසාදයට පත් නොවෙන ආකාරයට ගෞරවාන්විතව සහ අභිමානවත් ලෙස කටයුතු කිරීමට අපි වගබලා ගත යුතුයි. සභා රීති මාලාවට සහ සභා පණතට යටත්ව කටයුතු කරන තාක් කල් ඔබ අප සියළු දෙනාගේම ගෞරවය සහ අභිමානය රැකේවි යැයි මා විශ්වාස කරනවා.

මේ සභාවට නවක මන්ත්‍රීවරයෙක් ලෙස මා පැමිණෙන විට අපේ ජයතිලක මන්ත්‍රීතුමා වැනි මට වඩා ජ්‍යෙෂ්ඨ ගරු මන්ත්‍රීතුමන්ලාගේ උපදෙස් ලබා ගත්තා. ඔවුන් අපිට නිසි මග පෙන්වීම් අදටත් ලබා දෙනවා. ඒ නිසා මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන මහජන නියෝජිතයින් ලෙස මේ සභාවේ අභිමානය, ගෞරවය ආරක්ෂා වන පරිදි සෑම විටම කටයුතු කිරීම අපේ වගකීමක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මගේ කොට්ඨාශයේ මඩවල ප්‍රදේශයේ අමිල සුගත් වීරසිංහ මහතා මඩවල හන්දියේ මාළු වෙළඳසැලක් පවත්වාගේන යාම සඳහා පසුගිය දිනක ඉල්ලීම් ලිපියක් ඉදිරිපත්කලා. එම පුද්ගලයා ජීවත් වීමට සිදු කරන ව්‍යාපාරයක් බැවින් එයට අවසරය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

පසුගිය සභා වාරයේදී ඇතිවූ ගැටළුව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් 15 දෙනා වෙනුවෙන් මම කණගාටුව ප්‍රකාශ කරනවා. එසේ සිදු වූයේ ආණ්ඩු පක්ෂයට ඇතිවූ කලකිරීම සහ අසාධාරණය හේතු කොටගෙනයි. එමෙන්ම තමන්ගේ කොට්ඨාශයේ වැඩක් කරන විට එහි නායකත්වය ගැනීමට සෑම මන්ත්‍රීවරයෙක්ටම හැකියාව තිබිය යුතුයි. කුමන සභාපතිවරයෙක් සභාපති ධූරයේ කටයුතු කලත් මගේ කොට්ඨාශයේ මා විසින් කල යුතු වැඩ මම සිදු කරනවා. එහිදී මම දේශපාලන පක්ෂ භේදයක් අදාල කර ගන්නේ නැහැ. අපේ කොට්ඨාශ 15හි සංවර්ධන කටයුතු වෙනුවෙන් පක්ෂ භේදයකින් තොරව අපි කටයුතු කරමු. අපි මෙතනට රැස්වන්නේ දේශපාලනය කිරීමට නොවෙයි. ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් ඔවුන්ගේ ඉල්ලීම් ගෙනවිත් සාකච්ඡා කර ඒවා ඉටු කර දීමටයි. සුහදව එකමුතුව කටයුතු කර ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය වෙනුවෙන් අවශ්‍ය සහයෝගය ලබා දෙමු යැයි මා ප්‍රකාශ කරනවා. මින් ඉදිරියට අපි සියළු දෙනා සාකච්ඡා කර වැඩපිළිවෙලවල් සකස් කර ගැනීම තුලින් අලව් පුරවරය බබලවන්නට ඔබතුමියට අවශ්‍ය කරන සහයෝගය සහ ශක්තිය ආණ්ඩු පක්ෂයක් ලෙස ලබා දෙන බව මම ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අග්බෝව ප්‍රදේශයේ ක්‍රීඩාපිටි සුද්ධ කිරීම පිළිබඳව ස්තූතිය ප්‍රකාශ කරන ලෙස ප්‍රදේශයේ තරුණ පිරිස විසින් ප්‍රකාශ කලා. ඒ සම්බන්ධයෙන් ඔබතුමියටත්, මන්ත්‍රීතුමන්ලාටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තූතිය පුද කරනවා. ගිය වර්ෂයේ 08 වැනි මාසයේ 04 වැනි දින බැම්මක් බැදීම හේතුවෙන් මගේ නිවස අසල නිවසෙහි ජල මාර්ග අවහිර වන බවට ගරු මහ සභාවට ලිපියක් එවා තිබෙනවා. එම පැමිණිල්ල පිළිබඳව අපේ තාක්ෂණ නිලධාරීන් ගොස් නිරීක්ෂණය කර නිර්දේශත් ඉදිරිපත් කර තිබුනා. නමුත් මේ වන තෙක් එයට විසඳුමක් ලැබී නැහැ. ඒ පිළිබඳව ඔබතුමියගේ අවධානයට යොමු කිරීමට කැමතියි.

එමෙන්ම මගේ නිවස ඉදිරියේ කෙත් සිසිල නමින් ඉඩමක් වෙන්දේසි වන බව මම සභා වාර ගණනාවකදීම ප්‍රකාශ කලා. නමුත් මේ පිළිබඳව සභාව විසින් මේ වන තෙක් කිසිදු විමර්ෂණයක් සිදු කර නැහැ. ඔවුන් එම ඉඩම වෙන්දේසි කරන්නේ සභා අනුමැතිය ඇතිව ද යන්න පිළිබඳවත් අපිට සැකයක් තිබෙනවා.

වීථි ලාම්පු සකස් කිරීම පිළිබඳව කතාකරන විට සභාවේ මහජන නියෝජිතයින් ලෙස වීථි පහන් සකස් කිරීමට අපිම යා යුතු යැයි මා සිතන්නේ නැහැ. අවශ්‍ය ස්ථාන ටික නම් කර ලිපියක් ඉදිරිපත් කිරීම මගින් හෝ නියෝජිතයෙකු සම්බන්ධ කිරීමෙන් හෝ එය සිදු කිරීම ප්‍රමාණවත් බව මගේ අදහසයි. වීථි පහන් සකස් කිරීමේ කටයුතු මෙවැනි ඉතා හොඳ වැඩපිළිවෙලක් යටතේ ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඔබතුමියට අපේ ස්තූතිය ප්‍රකාශ කරනවා.

අපේ ප්‍රදේශයේ ඉතා කුඩා ලෙස ගඩොල් කර්මාන්තය කරගෙන යන එමෙන්ම කුකුල්ලු 10 ක් 15 ක් හදන එවැනි කුඩා ප්‍රමාණයේ ව්‍යාපාර සිදු කරන සියළු දෙනාටම පරිසර බලපත්‍ර ලබා ගන්නා ලෙස ලියුම් එවා තිබෙනවා. දින 14 ක් තුල බලපත්‍ර නොගන්නේ නම් නඩු දමන බව සඳහන් කර තිබෙන නිසා මෙම ජනතාව බියට පත් වී සිටිනවා. එම නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

එමෙන්ම  මම මීට කලින් සභා වාරයේදීත් අවධානය යොමු කල පරිදි නවතල්වත්ත මාර්ගයේ ජල නල එලීමේදී පාර දෙපැත්ත පළුදු වී තිබෙනවා.ඔවුන් මේ වන විට මීටර් 800 ක පමණ ප්‍රමාණයක දෙපස සකස් කර තිබුනත් ඉන් පල්ලෙහාට තිබෙන කිලෝමීටරයක පමණ ප්‍රමාණයක පාර සකස් කර නැහැ. පසුගිය වැසි කාලයේදී ගලාගිය ජලය නිසා මාර්ගය දෙපස ඛාදනය වී තිබෙනවා. අග්බෝව සුසාන භූමිය අසල තිබෙන පරණ බෝක්කුව පැත්තෙන් ජල නල එලීම සඳහා වලවල් දෙකක් කපා කොන්ක්‍රීට් කණු දෙකක් යොදා තිබෙනවා. එය සකස් කිරීමේදී මාර්ගයට හානි වී තිබෙනවා. වැහි කාලය වන විට එම මාර්ගය මෙම ස්ථානයෙන් කැඩුනහොත් බුජ්ජොමුව සිට නවතල්වත්ත දක්වා ගමනාගමනය සම්පූර්ණයෙන්ම ඇණහිටිනවා. එය කැඩී යාමට මත්තෙන් ඔවුන්ගේ අවධානය යොමු කර එය යාවත්කාලීණ කිරීමට කටයුතු කරනවා නම් වඩාත් හොඳයි.

අලව්ව පොලීසියේ කාර්ය භාරය පිළිබඳව කතා කරන විට ඔවුන්ගේ රාජකාරිය ක්‍රියාත්මක කිරීමේදී හැඳි දෙකකින් බෙදන ස්වභාවයක් තිබෙනවා. එනම් ඇතැම් මත්පැන් ජාවාරම් කරගෙන යාමට ඉඩදෙන අතර ඇතැම් මත්පැන් ජාවාරම් ඇල්ලීමට කටයුතු කරනවා. එවිට අපි ද මත්පැන් ව්‍යාපාරිකයින්ගේ චෝදනාවට ලක් වෙනවා. පොලීසියේ එම අසාධාරණ ද්විත්ව ක්‍රියාක්රීත්වය පිළිබඳවත් අවධානය යොමු කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, ගනේකන්ද ප්‍රදේශයේ අළුතින් ඉදි කරන වතුර ටැංකිය ආශ්‍රිත මාර්ගය කැඩී යාම සම්බන්ධයෙන් අදාල කොන්ත්‍රාත්කරුවන් එම මාර්ගය සකස් කර දීමට පොරොන්දු වී සිටිනවා. ඒ සඳහා මාර්ගය ලකුණු කර දෙන ලෙසට ඉල්ලීමක් කර තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගොරොක්ගස්දෙණිය පරණවත්ත මාර්ගය කාපට් කිරීමේදී කාණු පද්ධතිය සහ අවශ්‍ය ස්ථානවල ජල බැස්ම සඳහා බෝක්කු ඉදි කිරීම මේ වන විට සිදුකරමින් පවතිනවා. එහිදී පරණවත්ත ප්‍රදේශයේ එක් ස්ථානයක මාර්ගය උඩින් වතුර දමනවා. මෙම ස්ථානයේ බෝක්කුව සකස් කිරීමට යාබද ඉඩමේ හිමිකරුවන් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. එම නිසා මාර්ගයේ අදාල ස්ථානවල බෝක්කු ඉදි කිරීමේදී තාක්ෂණ නිලධාරීන් හරහා අදාල සමාගමට අවශ්‍ය කටයුතු කරගෙන යාම සඳහා බලය පැවරීමක් සිදු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

පෙර සඳහන් කල ගනේකන්ද වතුර ටැංකිය අසල මාර්ගය ඉදි කිරීමේදී සමහර තැන්වල ජල බැස්ම වෙනස් වී තිබෙනවා. එම නිසා රතනාලංකාර මහා විද්‍යාලය ප්‍රදේශයට ජලය බැස යාම සිදු වෙනවා. ඒ අනුව එම ප්‍රදේශය ජලයෙන් යටවෙන තත්වයක් උදා වී තිබෙනවා. ඒ සඳහා කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණයක් සිදු කර විසඳුමක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

පසුගිය සභා වාරයේ සිදු වූ සිදුවීම සම්බන්ධයෙන් කතා කරන විට පෞද්ගලිකව ඔබතුමියත් සමඟ හෝ වෙනත් අපේ කිසිදු මන්ත්‍රීවරයෙකු සමඟ පෞද්ගලික තරහක් අපි තුල නැහැ. අපි සියළු දෙනාම මෙම සභාවට පැමිණ සිටින්නේ ජනතාව වෙනුවෙන් සේවයක් කිරීමේ උතුම් අරමුණිනුයි. එහිදී අපි අතර යම් යම් මතගැටුම් ඇතිවිය හැකියි. ඔබතුමියගෙන් අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉල්ලා සිටියේ ආණ්ඩු පක්ෂයක් ලෙස කටයුතු කිරීමේදී අපි අතර යම් අනවබෝධයක් ඇත්නම් එය දුරු කරගෙන අවබෝධයෙන් ඉදිරියට යාමට අවස්ථාව සලසා දෙන ලෙසයි. ඒ අනුව ඔබතුමිය මේ සඳහා මැදිහත් වී අවශ්‍ය කටයුතු සිදු කරනු ඇතැයි බලපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙතන සිටින සියළුම මහජන නියෝජිතයින්ට අවශ්‍ය මහජන සේවයක් සිදු කිරීමටයි. එහිදී සියළු දෙනාම සහෝදරත්වයෙන් එකට ගමනක් යාමේ උවමනාව සියළු දෙනාටම තිබෙනවා. අපි සියළු දෙනාම ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ කිසිවෙකුගේ සිත් රිදවන්නේ නැතිව සියළු දෙනාම සාකච්ඡාවෙන් සම්මුතියෙන් එක්ව ගමනක් යමු යැයි මම යෝජනා කරනවා. සියළු දෙනා බලාපොරොත්තු වන්නේ තම ප්‍රදේශයට යහපත් මෙහෙවරක් ඉටු කිරීමටයි. සියළුම මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරගෙන ජනතාවට සේවයක් වන ආකාරයට යහපත් සභාවක් සකස් කිරීමට ඔබතුමියටත් අපේ සියළුම මන්ත්‍රීවරුන්ටත් ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022 අවුරුද්ද සඳහා ජනතාව වෙනුවෙන් බලාපොරොත්තු වන මෙහෙවර ඉටු කිරීමට හැකිවන තැනකට ඒකරාශී වීම පිළිබඳව සතුටු වෙනවා. ඔබතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද ගැටළු පිළිබඳව කතා කරන විට ජයතිලක මන්ත්‍රීතුමා විසින් බලාපොරොත්තු නොවූ පරිදි ඉදිරිපත් කල ගියවර මහා සභා වාර්තාවේ මගේ ප්‍රකාශයෙන් බොහෝ ගැටළු වලට පිළිතුරු ලැබුන බව මා සිතනවා. පසුගිය කාලයේ විදුලි පහන් සවිකිරීම පිළිබඳව සලකා බලන විට මුදල්, කාලය නාස්ති වීම සහ නිලධාරීන්ගේ මෙහෙවර නිසියාකාරයෙන් සිදු කෙරෙනවාද යන ප්‍රශ්නය ඇති වුනා. මෙම වැඩපිළිවෙල සකස් කලේ සැලසුම් සහගතව මෙම කටයුත්ත කිරීමට අවශ්‍ය නිසයි. එහිදී අපි මුලින්ම කොට්ඨාශයේ සිටින ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමාව දැනුවත් කරනවා. එසේ සිදු කරන්නේ කාලය ඉතිරි කර ගැනීමට මෙන්ම අදාල ප්‍රදේශයට අවශ්‍ය සේවාව සම්පූර්ණයෙන් සිදු වීමටයි. එය ක්‍රමවත් ලෙස සකස් කොට කොපමණ විදුලි පහන් ප්‍රමාණයක් සවි කලා ද යන්න අත්සන් ගනු ලබනවා. එවිට එක වසමක අදාල කාලසීමාව තුල විදුලි පහන් කොපමණ ප්‍රමාණයක් සවි කලා ද යන්න පැහැදිලිව දැන ගැනීමේ හැකියාව දැන් තිබෙනවා. ඔබතුමන්ලාටත් එම වාර්තා ඉදිරිපත් කරනවා. ඒ අනුව යම් ගැටළුවක් තිබෙනවා නම් තවදුරටත් ඒවා නිරාකරණය කර ගැනීමේ හැකියාව තිබෙනවා. තමන්ගේ කොට්ඨාශයේ පමණක් නොව මෙම බල ප්‍රදේශයේ කොහේ හෝ ස්ථානයක ඔබතුමන්ලා ප්‍රශ්නයක් දුටුවහොත් ඒවා ඉදිරිපත් කරන්න. එවිට අදාල කොට්ඨාශයේ මන්ත්‍රීතුමාවත් දැනුවත් කර එම ගැටළු විසඳා ගමු. වීථි පහන් සකස් කිරීමේදී අදාල කොට්ඨාශයේ මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙක් සිටිනවා නම් කතා බහ කර

කටයුතු කිරීමට හැකි නම් හෝ නැතිනම් මන්ත්‍රීවරු දෙදෙනාට දින දෙකක දී අදාල කටයුතු සිදු කරගැනීමට හැකියි.

එමෙන්ම මාර්ග සකස් කර ගැනීම සඳහා මෝටර් ග්‍රේඩරයත්, JCB යන්ත්‍රයත් ඉල්ලුම් කර තිබෙනවා. ඒ සඳහාත් ලිපි ඉදිරිපත් කරනු ලැබූ ආකාරයට පෙලගස්වා එක් ප්‍රදේශයක වැඩ එකවර සම්පූර්ණ කර ගැනීමට හැකිවන ලෙස කාලසටහනක් සකස් කර තිබෙනවා. ඒ අනුව ඔබතුමන්ලාගේ අවශ්‍යතාවයන් ඉදිරිපත් කරන්න. අපි එම වාහන ලබා දීමට කටයුතු කරනවා.

හිටපු ගරු සභාපති සන්ධ්‍යා කුමාර මැතිතුමා අපි සියළු දෙනාට වීථිපහන් 05 බැගින් ලබා දුන්නා. එතුමාව ගෞරවයෙන් සිහිපත් කරනවා. මා විසින් කිසිවෙකුට අළුතෙන් විදුලි පහන් ලබා දුන්නේ නැහැ. මන්ත්‍රීවරු ලඟ තිබූ ඒවාට අඩුපාඩු සපයා දී ඔවුන් විසින් ඒවා යථා තත්වයට පත් කරගෙන තිබුනා.

ජලනල එලීම පිළිබඳ ගැටළු බොහොමයක් තිබෙනවා. ගනේකන්ද මාර්ගය සම්බන්ධයෙන් අදාල සමාගම විසින් අප සමඟ ප්‍රකාශ කලේ බර වාහන ගමන් කිරීම නිසා දැන්ම එම මාර්ගය සකස් කිරීමෙන් ඵලක් නොවන බවත් වැඩ අවසන් වූ විට මායිම් ලකුණු කර දෙන ලෙසයි. කෙසේ වෙතත් නැවත වතාවක් අපි ඒ පිළිබඳව සොයා බලා කාර්මික නිලධාරී වාර්තාව රැගෙන කටයුතු කරන්නම්.

මගේ කොට්ඨාශය තුල වුවත් කුමන කොට්ඨාශයක වුවත් යම් මාර්ග ප්‍රශ්නයකදී අපි කටයුතු කරන්නේ කාර්මික නිලධාරියෙක් යොමු කර ඔහුගේ වාර්තාවට අනුවයි. නැතහොත් අපි සියළු දෙනාටම යම් යම් ප්‍රශ්න වලට මුහුණ දීමට සිදු වෙනවා. එම නිසා එවැනි ගැටළු කරුණාකර ලිඛිතව ඉදිරිපත්කරන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම අපිට සිටින කාර්මික නිලධාරීන් මෙන්ම කම්කරුවන් ප්‍රමාණවත් නැහැ. එම නිසා සැලැස්මකට අනුව අදාල වැඩ කටයුතු සිදු කරගත යුතු වෙනවා.

මම මේ සභාවේ සභාපති ධූරය දරණ විට බලප්‍රදේශයේ සිටින ජනතාවට වගකිව යුතුයි. එමෙන්ම සභාවේ සිටින සභිකයින් සියළු දෙනා පිළිබඳව යම් කිසි මට්ටමකින් කටයුතු කල යුතුයි. මම නියෝජනය වන පක්ෂයේ ගෞරවය මෙන්ම මා ගැන විශ්වාසය තැබූ නායකයින්ගේ ගෞරවයත් මම ආරක්ෂා කල යුතුයි.

අපිට දේශපාලනය තනිවම කල නොහැකියි. නමුත් තවත් කෙනෙකුගේ අභිමථාර්තය ඉටු කිරීමට ගොස් තමන්ගේ ආත්ම අභිමානය සහ ආත්ම ගරුත්වය විනාශ කර ගන්නවාට වඩා අපිව තොරා පත්කරගත් ජනතාවට සේවය කිරීම පිළිබඳව සිතා කටයුතු කලහොත් ඉතා හොඳ වැඩ කොටසක් මේ ප්‍රදේශයට කිරීමට අපිට හැකියාව ලැබෙනවා. අපි සියළු දෙනාම එකට එකතු වී වැඩ කරමු. සභාවේ සභාපති ලෙස සභිකයින් සියළු දෙනාටම ඇහුම්කන් දීමට මට වගකීමක් තිබෙනවා. එමෙන්ම මා නියෝජනය කරන පක්ෂයේ ප්‍රතිපත්ති ආරක්ෂා කර ගැනීමත් එම සභිකයින්ව ආරක්ෂා කර ගැනීමත් මා කල යුතුයි. එමෙන්ම මහජනතාව වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටු කල යුතුව තිබෙනවා. ඒ සඳහා ඔබ සියළු දෙනාගේම සහයෝගය මින් ඉදිරියට ලබා දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මට දීමට හැකි උපරිම සහයෝගය ඔබ සියළු දෙනාටම ලබා දෙන බව මතක් කරමින් ඔබ සියළු දෙනාගේම ඉල්ලීම් වලට හැකි උපරිම ආකාරයට අවස්ථාව ලබා දෙන බවත් මතක් කරනවා.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා.

අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 12.00 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2022/01/25<br>
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,<br>
අලව්ව ප්‍රාදේශීය සභාව,<br>
අලව්ව.